
# 4.2.3 (බන්ධුල ජයවර්ධන )



**උපත:** ජූනි 15, 1926, රත්නපුර

**විපත:-** නොවැම්බර් 21, 2003

**අධ්‍යාපනය:-** රත්නපුර ජේසු බිලිදාගේ කන්‍යාරාමය, ෆර්ගසන්උසස් විදුහල, සීවලි මහා විදුහල, බම්බලපිටිය ශාන්ත පීතර යන විදුහල්වලින් හා පේරාදෙණිය සරසවියෙන් ශාස්ත්‍රවේදි දර්ශන උපාධිධාරියෙකි.

**රැකියාව:** ගුරුවරයෙකු, කථිකාචාර්යවරයෙකු

**ජීවන තොරතුරු:-**

කේ.වී.ජී.ජයවර්ධන හා මර්සියානා විජේසිංහ යුවලට දාව රත්නපුර නෙරළුප දී උපත ලැබූ බන්ධුල ජයවර්ධන (1962) පවුලේ බාලයා විය. රත්නපුර ජේසු බිළින්දාගේ කන්‍යාරාමය, පර්ගියුසන් බාලිකා විද්‍යාලය හා සීවලී විද්‍යාලය යන විද්‍යාල වලින් අධ්‍යාපනය ලද ඔහු පාසල් අවදිය තුළදීම සිය දක්ෂතාවයන් පෙන්විය.

පසුව කැගලු විද්‍යාලයටත්, කොළඹ ශාන්ත පීතර විද්‍යාලයටත් ඇතුළත් විය. පාසල් අවධියේදී සාහිත්‍ය, නාට්‍ය ආදී ක්ෂේත්‍රයන් තුළ දස්කම් පෑවේය.

සිංහල හා ඉංග්‍රීසි භාෂා විෂය ද්වයයෙහි විශිෂ්ට පඬිවරයකු වූ ඔහුගේ විචාරක භූමිකාව, නාට්‍ය විනිශ්චය පිළිබඳ දීර්ඝ කාලීන අත්දැකීම් සම්භාරය, මෙරට එක්තරා කාල පරිච්ඡේදයක සිංහල නාට්‍ය අරබයා කෙරුණු මා හැඟි දායකත්වයක ස්මරණ ලෙස පෙනේවිශේෂයෙන් ම මෙහිදී . අපට කැපී පෙනෙන්නේ බන්ධුල ජයවර්ධන තුළ ග්‍රීක නාට්‍යසම්ප්‍රදාය, ග්‍රීක නාට්‍යය පිළිබඳ වූ පුළුල් හා ශාස්ත්‍රීය ඥාන සම්භාරය යි.

**වෘත්තීය තොරතුරු:-**

1968 සිට සිංහල නාට්‍ය අනු මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කළ එහු 1976 දී සිංහල නාට්‍ය අනු මණ්ඩලයේ සභාපති ධුරයට පත්විය. තවද එම තනතුරේ සිටින කාලය තුලදී ඔහු විසින් රාජ්‍ය රංග කලා ආයතනයක් (State Institute of Arts) බිහිකිරීය.


- ❖ **ඔහුගේ නාට්‍ය නිර්මාණ:-**

1958 වර්ෂයේ සෝෂක වස්තුව නිර්මාණය කරමින් නාට්‍යකරණයට පිවිසියේ ය.

- **1961 වර්ෂයේ දී ග්‍රීක මහා නාට්‍යකරු සොෆොන්ලීස්ගේ ඉක්නෙවුටා ඉනම් සැටර් නාට්‍ය බෙරහඬ නමින් අනුවර්තනය කර අධ්‍යක්ෂණය කිරීම.**
- 1963 වර්ෂයේ දී දියසේන නොපැමිණීම නම් ස්වතන්ත්‍ර නාට්‍ය නිර්මාණය කිරීම.
- 1965 වර්ෂයේ දී ස්වර්ණ හංස නාට්‍යය නිර්මාණය කිරීම.

• 1966 වර්ෂයේ දී බිහි වූ බෝසතාණනි නම් නාට්‍ය අනුවර්තනය කර අධ්‍යක්ෂණය කිරීම. (චෙකොස්ලොවැකියානු නාට්‍යකරු කැරල්චැපෙක් සහෝදරයන්ගේ කෘමිනාටක (Insect Play) හි අනුවර්තනයකි)
• 1999 වර්ෂයේ දී ස්වර්ණමාලි නාට්‍ය රචනය සහ අධ්‍යක්ෂණය කිරීම

## බෙරහඬ නාට්‍යය 1961
## https://youtu.be/RVHYvXh9hDo



හනික වරෙව් කොල්ලනේ
මෙන්න මෙහෙ වරෙව්
මෙන්න මෙහෙ වරෙව්
කොල්ලනෙ නට නටා වරෙව්
තොපිට හරිම වාසියක්
නට නටා වරෙව් යකෝ!

සෑම උදෑසනකම තම ගව රැන ද පෙරටු කරගෙන අහසේ සැරිසරන හිරු දෙවියන්ගේ ගව රැන යමෙකු විසින් හොරකම් කර තිබේ. ඒ හොරා කවුදැයි සොයා ගැනීමට පවරන්නේ යක් රජුටය. ඉහත ගීයෙන් යක් දෙටුවා අමතන්නේ තම යක් රැනටය. හිරු දෙවියන්ගේ හරක් හොරා අල්ලා දුනහොත් බොහෝ තෑගි බෝග ලැබෙනු නියතය. එහෙත් අවසන සිදු වන්නේ කුමක්ද? හොරා කුඩා දරුවෙකි. ඔහු බෙරය නම් සංගීත භාණ්ඩය තනා ඇත්තේ වයස අවුරුදු හයේදීය. එතරම් දස්කම් ඇති පන්සිළු නම් දරුවා මිනිස් මවකගේ කුසින් උපන්නද ඔහුගේ පියා ශක්‍ර දිව්‍ය රාජයාය ඒ නිසා දඬුවම් දීම වෙනුවට සිදුවන්නේ පන්සිළු දිව්‍ය ලෝකයට රැගෙන යෑමයි. මේ බෙරහඬ කතාවේ ඉතාම සරල සංක්ෂිප්තයයි.

❖ <u>මෙම නාට්‍යයේ විශේෂත්වය වන්නේ,</u>

- ග්‍රීක නාට්‍ය රචක සොෆෝක්ලීස්ගේ ඉක්නෙව්ටායි නම් සැටර් නාට්‍ය අනුසාරයෙන් අනුවර්තනයක් ලෙස බෙරහඬ නාට්‍ය බිහිවිය.
- දේශීය ජනකවි , තාල , ශාන්තිකර්ම කවි , බෙර ආදිය භාවිතා කරමින් අපට ගැලපෙන ලෙස නාට්‍ය සකස් කොට ඇත.

## ❖ ඔහු අතින් නිර්මාණය වූ ශාස්ත්‍රීය කෘති:-

- රූපණ 1 සඟරාව
- ග්‍රීක නාට්‍ය කලාව හා ප්‍රේක්ෂක ඔබ (චන්ද්‍රසෝම විතානගේ සමඟ)
- සකලජන -මධ්‍යකාලීන යුගයේ ලියැවුණු ඇඩැරහ ප්බ නම් මොරැලිටි නාට්‍යයේ අනුවර්තන රචනය
- මොනරපිල් - ප්‍රකට නාට්‍ය කරුවෙකු - වූ මොලියර්ගේ ද බුර්ෂුවා ජෙන්ටිල්ඩම් නාට්‍යයේ අනුවර්තන රචනය
- සම්භාව්‍ය ග්‍රීක නාට්‍ය කලාව (විජේරත්න පතිරාජ සමඟ)
- නාට්‍ය ප්‍රභේද -ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි.
- නාට්‍ය පෙළ අධ්‍යයනය -ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශනයකි.

මේ ආකාරට බන්දුල ජයවර්ධනයන්ගේ ජීවිතයේ වැඩි කාලයක් නාට්‍ය හා රංගකලාවේ ප්‍රවර්ධනය උදෙසා කටයුතු කල මෙතුමා , දිවයින පුරා විසිරී, පැතිරී සිටි දක්ෂ ශිල්පීන් ඒකරාශි කර රාජ්‍ය නැටුම් හා සංගීත කණ්ඩායම පිහිටු වීමට පුරෝගිමී වූ බන්දුල ජයවර්ධනයන්ගෙන් ලාංකීය නාට්‍ය කාවට ඉටු වූ මෙහෙය අප්‍රමාණය.

link- **https://youtu.be/RVHYvXh9hDo**